national secretariat for media reforms - Sri Lanka

**නිරීක්ෂණ වාර්තා අංක 1**

(2018 ජනවාරි -31)

# පළාත් පාලන මැතිවරණය -2018 පෙබරවාරි මැතිවරණ ක්‍රියාදාමය සහ ප්‍රචාරණ ක්‍රියාවලිය ජනමාධ්‍ය විසින් ආවරණය කර ඇති ආකාරය පිළිබඳ පළමු අතුරු තක්සේරු වාර්තාව

## හැඳින්වීම

2018 පළාත් පාලන මැතිවරණ සමයේ මාධ්‍ය උපමාන හා මාධ්‍ය භාවිතය පිළිබඳව සහ මාධ්‍ය භාවිතය මඟින් මැතිවරණයේදී නිදහස් සහ සියලු සහ සමස්ත තොරතුරුවලින් සන්නද්ධව දැනුවත් තීරණයක් ගැනීමට ඡන්දදායකයාට ඇති කරන බලපෑම පිළිබඳව මෙම අධ්‍යයනයේදී අවධානය යොමු කෙරේ.එම නිරීක්ෂණ අදාළ බලධාරීන් හා සමාජය හමුවේ ඉදිරිපත් කරමින් ක්‍රියාශීලි සහ ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් සඳහා වඩාත් යහපත් වෘත්තීයභාවයෙන් යුතු මාධ්‍ය සංස්කෘතියක් ඇති කරගැනීම සඳහා පුළුල් සංවාදයකට ඉඩ හසර විවර කිරීම මෙම අධ්‍යයනයේ අරමුණයි.

2018 පළාත් පාලන මැතිවරණ සමයේ ජනමාධ්‍ය විසින් සිය කාර්යයන් සහ වගකීම් ඉටුකිරීමේදී , ඡන්දදායකයාට සියලු සහ සමස්ත තොරතුරුවලින් දැනුවත්ව නිදහසේ තීරණයක් ගැනීමට හැකි වන පරිදි මාධ්‍ය මඟින් නිවැරදි, අපක්ෂපාතී සහ සමබර තොරතුරු ඉදිරිපත් කිරීමක් සිදු කරන්නේද, මාධ්‍ය තුළ විවාදයට සහ විධිමත් ගැඹුරු සාකච්ඡාවකට සුදුසු ඉඩ හසරක් ලබාදී තිබේද, මැතිවරණ ආවරණයේදී මැතිවරණ කොමිෂන් සභාව විසින් හඳුන්වා දී ඇති මාධ්‍ය උපමාන, මාධ්‍යකරණයේදී ජාත්‍යන්තරව පිළිගත් ආචාරධර්ම හා ප්‍රතිමාන පිළිපැද තිබේද යන්න පිළිබඳව මෙම අධ්‍යයනයේදී විශේෂයෙන් සලකා බලනු ලැබේ.

# 675 A, Ethulkotte, Kotte, Sri Lanka
http://www.nsmrlk.org
pradeep@nsmrlk.org
094718607797

**ක්‍රමවේදය**

ජනමාධ්‍ය අන්තර්ගත විශ්ලේෂණ පර්යේෂණ ක්‍රමවේදය මෙම පර්යේෂණය සඳහා යොදගනු ලැබේ.ඒ අනුව තෝරාගත් නියැදියට අදළව මෙරට පළවන දිනපතා සහ සතිපතා පුවත්පත් සහ විකාශය වන රූපවාහිනී නාලිකාවල ප්‍රවෘත්ති අන්තර්ගතය දත්ත වශයෙන් ඒකරාශි කර විශ්ලේෂණය කර ඇත.

ප්‍රවෘත්ති සහ වැඩසටහන් කාලය විනාඩි සහ තත්පරවලින්ද , පුවත්පත් ප්‍රවෘත්ති හා විශේෂාංග අන්තර්ගතය වර්ග සෙ.මී.වලින්ද ගණනය කරමින් දත්ත ඒකරාශි කර ඇත. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක මැතිවරණ සමයේ ජනමාධ්‍ය භූමිකාව කෙරෙහි අවධානය යොමු කරමින් මැතිවරණ කොමිෂන් සභාවේ මාධ්‍ය උපමාන සහ සහ ජාත්‍යන්තර වශයෙන් පිළිගත් වෘත්තීය ජනමාධ්‍ය ප්‍රමිතීන් මත පිහිටා මෙම අධ්‍යයන වාර්තාව තුළ ගුණාත්මක සහ ප්‍රමාණාත්මක මිශ්‍ර ක්‍රමවේදයක් යොදගනිමින් දත්ත ඒකරාශි කර විශ්ලේෂණය කර ඇත.

පළමු අතුරු තක්සේරු වාර්තාව මඟින් අවධානය යොමු කර ඇත්තේ, **තැපැල් ඡන්දයේ ආරම්භක දිනය සහ ඊට පෙර දෙදින තුළ (ජන. 20-22)** ජාතික රූපවාහිනිය, ස්වාධීන රූපවාහිනිය, සිරස,ස්වර්ණවාහිනිය, දෙරණ, හිරු යන රූපවාහිනි නාලිකා 6 හි රාත්‍රී ප්‍රධාන ප්‍රවෘත්ති විකාශයේ (සිංහල) පුවත් අයිතම අන්තර්ගතයේ සහ එම දින තුනෙහි පළවූ ලංකාදීප, ඉරිදා ලංකාදීප, දිවයින, දිවයින ඉරිදා සංග්‍රහය, ලක්බිම, ලක්බිම ඉරිදා සංග්‍රහය, මව්බිම, මව්බිම-ඉරිදා, ජනයුගය, ජනයුගය (ඉරිදා), දේශය, රාවය, ලංකා ඉරිදා සංග්‍රහය, දිනමිණ, සිළුමිණ, රැස, අද සහ ඇත්ත යන දිනපතා සහ සති අන්ත සිංහල පුවත්පත් 20 හි මුල් පිටුවේ ප්‍රවෘත්ති (මුල් පිටුව සහ මුල් පිටුවේ පුවත් ඉතිරිය) අන්තර්ගතයේ මැතිවරණයට අදාළ පුවත් එක් එක් දේශපාලන පක්ෂ අතර බෙදී ගොස් ඇති ආකාරය පිළිබඳවයි.

**නිරීක්ෂණ**

ජනවාරි 20,21,22 අදාළ දින 3 තුළ අධ්‍යයනයේදී සලකා බැලුණු රූපවාහිනී නාලිකා 6 හි සමස්ත ප්‍රවෘත්ති කාලය පැය 8 විනාඩි 12 කි. එම දින 3 තුළ පළවූ දිනපතා හා සති අන්ත පුවත්පත් 20 හි නිරීක්ෂණය කළ සමස්ත පුවත් අන්තර්ගතය 44,320 $cm^2$ කි. එම සමස්ත පුවත් අන්තර්ගතය තවදුරටත් පහත පරිදි සවිස්තරාත්මකව හඳුනාගත හැකිය.

## (I). ප්‍රවෘත්ති අන්තර්ගතය- රූපවාහිනී සහ මුද්‍රිත මාධ්‍ය

**පුවත්පත් මුල්පිටුවල සහ රූපවාහිනී නාලිකාවල ප්‍රධාන පුවත් විකාශවල අන්තර්ගතය දේශපාලන පක්ෂ අතර සංඛ්‍යාත්මකව බෙදීගොස් ඇති ආකාරය.**

| සමස්ත ප්‍රවෘත්ති අන්තර්ගතය ( රූපවාහිනී /මුද්‍රිත) | සමස්ත පුවත් අයිතම සංඛ්‍යාව | මැතිවරණයට අදළ නොවන පුවත් | මැතිවරණයට අදළ පුවත් | | ඒ ඒ දේශපාලන පක්ෂ වෙනුවෙන් වන නියෝජනය | | | | | ඡන්දදායකයා මැතිවරණය පිළිබද දැනුවත් කිරීම් | මැතිවරණයට අදළ, දේශපාලන පක්ෂයකට අයත් නොවන වෙනත් පුවත් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සෘජු | වක්‍ර | එ.ජ.නි.ස | එ.ජා.ප | ශ්‍රී.ල.පො.පෙ | ජ.වි.පෙ | වෙනත් පක්ෂ | | |
| නිරීක්ෂණය කරන ලද පුවත්පත්වල මුල්පිටු පුවත් | 206 | 71 | 39 | 96 | 21 | 37 | 26 | 5 | 3 | 13 | 30 |
| නිරීක්ෂණය කරන ලද රූපවාහිනී නාලිකාවල ප්‍රධාන පුවෘත්ති විකාශයන්හි පුවත් | 279 | 65 | 186 | 28 | 61 | 54 | 39 | 20 | 9 | 6 | 25 |
| එකතුව | 485 | 136 | 225 | 124 | 82 | 91 | 65 | 25 | 12 | 19 | 55 |

වගු අංක- 01-




ප්‍රස්තාර අංක-01

## (II). ප්‍රවෘත්ති අන්තර්ගතය- දිනපතා සහ සති අන්ත පුවත්පත්

නිරීක්ෂණය කරන ලද කාලය තුළ පළවූ දිනපතා සහ සති අන්ත පුවත්පත්වල මුල් පිටුවේ පළවූ පුවත් අයිතම සංඛ්‍යාව (මුල් පිටුවෙන් ඇතුළු පිටුවට ඉතිරි සහිතව) 206 කි. එයින් 71 ක් මැතිවරණයට අදාළ නොවන පුවත් වන අතර ඍජුව (39) සහ වක්‍රව (96) මැතිවරණයට අදළ පුවත්ය. ඒවා ඒ ඒ දේශපාලන පක්ෂ අතර බෙදීගොස් ඇති ආකාරය පහත දැක්වෙන වගු අංක 2 මඟින් නිරූපිතය.

| පුවත්පත | මුළු පුවත් | මැතිවරණය ට අදාළ නොවන පුවත් | මැතිවරණයට අදාළ පුවත් | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සෘජු | වකු | එජනිස | | එජාප | | ශ්‍රීලපොපෙ | | ජවිපෙ | | වෙනත් | | ඡන්දදායකයා දැනුවත් කිරීම් |
| | | | | | ධන | සෘණ | ධන | සෘණ | ධන | සෘණ | ධන | සෘණ | ධන | සෘණ | |
| දිනපතා ලංකාදීප | 18 | 10 | 4 | 4 | | 2 | | 1 | | 3 | | | | | 1 |
| ඉරිද ලංකාදීප | 10 | 2 | 1 | 7 | | | 1 | 1 | 1 | | | | 1 | | 1 |
| දිනපතා දිවයින | 19 | 6 | 3 | 10 | 1 | | 3 | | 2 | 2 | | | | | 1 |
| ඉරිද දිවයින | 8 | | 1 | 7 | | | | 5 | 1 | | | | | | 1 |
| ඉරිද ලක්බිම | 5 | 2 | 1 | 2 | 1 | | 1 | | | 2 | | | | | |
| දිනපතා ලක්බිම | 13 | 7 | 3 | 3 | | 1 | | 1 | 1 | | | | | 1 | 2 |
| ඉරිද රිවිර | 8 | | 4 | 4 | 1 | 2 | | 1 | 2 | | | 1 | | | |
| දිනපතා රිවිර | 7 | 1 | 3 | 3 | | | | 2 | 1 | | | | | | 2 |
| ඉරිද මව්බිම | 9 | 2 | 1 | 6 | 1 | | 2 | 2 | 1 | 1 | 1 | 1 | | 1 | |
| දිනපතා මව්බිම | 10 | 5 | 3 | 2 | 1 | 1 | | 1 | 1 | | 1 | | | | |
| ඉරිද ජනයුගය | 8 | 2 | | 6 | | 2 | 1 | 1 | | | | | | | |
| දිනපතා ජනයුගය | 9 | 7 | 1 | 1 | | 1 | | | | | | | | | 1 |
| දේශය | 8 | | 2 | 6 | 3 | | 3 | 3 | 2 | | | | | | |
| රාවය | 7 | 1 | | 6 | | | | | | 2 | | | | | |
| ලංකා | 7 | 1 | | 6 | | 3 | | 4 | | | | | | | |
| ඇත්ත | 10 | 5 | 2 | 3 | | | | 3 | | | | | | | |
| දිනපතා දිනමිණ | 23 | 8 | 6 | 9 | 2 | 2 | 2 | | | 3 | | | | | 2 |
| සිළුමිණ | 11 | 7 | 1 | 3 | | | | | | | | | | | 1 |
| රැස | 8 | 3 | | 5 | | | | | | 2 | | | | | |
| අද | 8 | 2 | 3 | 3 | | 1 | | | | | 1 | | | | 1 |
| එකතුව | 206 | 71 | 39 | 96 | 10 | 11 | 12 | 25 | 14 | 12 | 3 | 2 | 1 | 2 | 13 |

වගු අංක 2

පහත ප්‍රස්තාරය මඟින් දැක්වෙන්නේ ඉහත පුවත්පත් 20 හි මුල් පිටුවේ පුවත් අන්තර්ගතය මැතිවරණයට සෘජුව අදාළ, වක්‍රව අදාළ සහ මැතිවරණයට අදාළ නොවන පුවත් ලෙස බෙදීගොස් ඇති ආකාරයයි. තැපැල් ඡන්දයට ආසන්න දින කිහිපය තුළ පොදුවේ සියලු මුද්‍රිත මාධ්‍යවල මැතිවරණයට අදාළ පුවත් වෙනුවෙන් වැඩි ඉඩ ප්‍රමාණයන් (65. 5) වෙන් වී ඇති බව එමඟින් නිරීක්ෂණය වේ.




ප්‍රස්තාර අංක 2

මුද්‍රිත මාධ්‍ය මුල් පිටුවේ පුවත් අයිතම නිරීක්ෂණය කිරීමේදී ඒ අතර මධ්‍යස්ථ ලෙස වාර්තා කර ඇති පුවත් මෙන්ම දේශපාලන පක්ෂවල ප්‍රතිරූපය ඉහළ නංවන පුවත් සහ දේශපාලන පක්ෂවල ප්‍රතිරූපයට හානි පමුණුවන ආකාරයෙන් වාර්තාකර ඇති පුවත්ද පවතින බව නිරීක්ෂණය කළ හැකිය.

ප්‍රමාණාත්මකව බැලීමේදී එම පුවත් මගින් ඒ ඒ දේශපාලන පක්ෂවලට නියෝජනයක් හිමිවී තිබුණද ඇතැම් අවස්ථාවලදී එම ඉඩ ප්‍රමාණය වෙන්වී ඇත්තේ පක්ෂ ප්‍රතිරූපය අවවර්ධනය කිරීම සඳහා බව පහත දැක්වෙන ප්‍රස්තාර අංක 3 නිරීක්ෂණය කිරීමේදී පෙනී යයි.

**මුල් පිටුවේ ප්‍රවෘත්ති අන්තර්ගතය තුළ ප්‍රවර්ධනාත්මක සහ අවවර්ධනාත්මක පුවත් අයිතම සංඛ්‍යාව**




ප්‍රස්තාර අංක 3

## (III). ප්‍රවෘත්ති අන්තර්ගතය -රූපවාහිනී නාලිකාවල රාත්‍රී ප්‍රධාන ප්‍රවෘත්ති විකාශය

නිරීක්ෂණය කරන ලද කාලය තුළ රූපවාහිනී නාලිකාවල රාත්‍රී ප්‍රධාන විකාශ තුළ විකාශය වූ සමස්ත පුවත් අයිතම සංඛ්‍යාව 279කි. එයින් 65 ක් මැතිවරණයට අදළ නොවන පුවත් වන අතර ඍජුව සහ වක්‍රව මැතිවරණයට අදළ පුවත් සංඛ්‍යාව 214 කි. පහත වගුව මඟින් දක්වෙන්නේ එම පුවත් අන්තර්ගතය ඒ ඒ දේශපාලන පක්ෂවලට බෙදී ගොස් ඇති ආකාරයයි.

**03.01. රූපවාහිනී නාලිකාවල ප්‍රවෘත්ති අන්තර්ගතය දේශපාලන පක්ෂ අතර සහ ඡන්දදායකයා දැනුම්වත් කිරීමේ පුවත් ලෙස බෙදී ගොස් ඇති අයුරු**

| නාලිකාව | සමස්ත පුවත් අයිතම සංඛ්‍යාව | මැතිවරණයට අදාළ නොවන පුවත් | සෘජුව හෝ වක්‍රව මැතිවරණයට අදාළ පුවත් | එ.ජ.නි.ස | එ.ජා.ප | ශ්‍රී.ල.පො.පෙ | ජ.වි.පෙ | වෙනත් පුවත් | ඡන්දදායකයා දැනුම්වත් කිරීම් |
|---|---|---|---|---|---|---|---|---|---|
| ජාතික රූපවාහිනීය | 69 | 10 | 59 | 17 | 16 | 12 | 6 | | 1 |
| ස්වාධීන රූපවාහිනිය | 56 | 10 | 46 | 17 | 13 | 3 | 4 | | 3 |
| සිරස | 31 | 3 | 28 | 10 | 4 | 4 | 4 | 9 | |
| ස්වර්ණවාහිනිය | 47 | 26 | 21 | 4 | 10 | 5 | 1 | | 1 |
| දෙරණ | 38 | 6 | 32 | 6 | 7 | 9 | 2 | | |
| හිරු | 38 | 10 | 28 | 7 | 4 | 6 | 3 | | 1 |
| එකතුව | 279 | 65 | 214 | 65 | 61 | 39 | 20 | 9 | 6 |

වගු අංක

පහත ප්‍රස්තාර අංක 4 මගින් නියැදියට අයත් නාලිකා 6 නිරීක්ෂිත දින තුනෙහි රූපවාහිනී ප්‍රවෘත්ති විකාශ තුළ මැතිවරණ සහ සෙසු පුවත් අන්තර්ගතය ප්‍රතිශතයක් ලෙස දක්වා තිබේ. එම කාලසීමාවේදී පොදුවේ රූපවාහිනී නාලිකා මැතිවරණයට සෘජුව හෝ වක්‍රව සම්බන්ධ පුවත් විකාශයට වැඩි ඉඩක් වෙන් කර ඇති බව නිරීක්ෂණය කළ හැකිය.




ප්‍රස්තාර අංක 4

නියැදියට අයත් රූපවාහිනී නාලිකාවල ප්‍රධාන ප්‍රවෘත්ති විකාශ තුළ පොදුවේ ඒ ඒ දේශපාලන පක්ෂ වෙනුවෙන් වෙන් කර ඇති පුවත් අයිතම පහත දැක්වෙන ප්‍රස්තාර අංක 5 මඟින් නිරූපිතය. සමස්තයක් ලෙස ගත් කළ ඇතැම් පක්ෂ වෙත වඩාත් පුළුල් නියෝජනයක් ලැබී තිබුණද , ඇතැම් පක්ෂ වෙත ලැබී ඇති නියෝජනය සාපේක්ෂව අඩු බව ප්‍රස්තාර අංක 5 තුළින් නිරීක්ෂණය කළ හැකිය.




ප්‍රස්තාර අංක 5

නියැදියේ නාලිකා 06 හි සමස්ත පුවත් අන්තර්ගතය තුළ ඇතැම් පක්ෂවල ප්‍රවර්ධනයට වැඩි ඉඩකඩක් වෙන්වී තිබුණද එය නාලිකාවෙන් නාලිකාවට වෙනස් බව ප්‍රස්තාර අංක 6 මඟින් නිරීක්ෂණය කළ හැකිය. සමීක්ෂණය කරන ලද දින තුනෙහි නියැදියට අයත් රූපවාහිනී නාලිකා 06 මඟින් සිය රාත්‍රි ප්‍රධාන ප්‍රවෘත්ති විකාශයන් තුළ ඒ ඒ පක්ෂ ප්‍රවර්ධනය වන ආකාරයට පක්ෂ වෙත පුවත් බෙදදී ඇති අන්දම ප්‍රතිශතාත්මකව සහ සංඛ්‍යාත්මකව එම ප්‍රස්තාරය මඟින් ඉදිරිපත් කර තිබේ. ඇතැම් රූපවාහිනී නාලිකා තමන් විසින් තෝරාගත් පක්ෂයකට වැඩි ඉඩකඩක් ලබාදෙමින් පක්ෂග්‍රාහී ආවරණයක නිරත වන බව එහිදී නිරීක්ෂණය කළ හැකිය.




| | ජාතික රූපවාහිනිය | ස්වාධීන රූපවාහිනිය | සිරස | ස්වර්ණවාහිනිය | දෙරණ | හිරු |
|---|---|---|---|---|---|---|
| ජ.වි.පෙ | 6 | 4 | 4 | 1 | 2 | 3 |
| ශ්‍රී.ල.පො.පෙ | 12 | 3 | 4 | 5 | 9 | 6 |
| එ.ජා.ප | 16 | 13 | 4 | 10 | 7 | 4 |
| එ.ජ.නි.ස | 17 | 17 | 10 | 4 | 6 | 7 |

ප්‍රස්තාර අංක 6

**මාධ්‍ය උපමාන හා මාධ්‍ය භාවිතය පිළිබඳව පොදු නිරීක්ෂණ**

මෙම අධ්‍යයනයේදී නිරීක්ෂණයට ලක්වූ රූපවාහිනි නාලිකාවල ප්‍රධාන ප්‍රවෘත්ති විකාශ හා පුවත්පත් මුල් පිටු ප්‍රවෘත්ති අන්තර්ගතය විශ්ලේෂණය කර බැලීමේදී **2017 දෙසැම්බර් 04, අංක 2048/1 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය** මඟින් මැතිවරණ කොමිෂන් සභාව විසින් පනවා ඇති මාධ්‍ය උපමාන පිළිබඳව පොදුවේ රූපවාහිනී හා මුද්‍රිත දෙඅංශයම ප්‍රමාණවත් අවධානයක් දක්වා නොමැති බව දක්නට ලැබේ.

(1) දෙවන උපමානය වන *'සෑම මාධ්‍යයක්ම සෑම පක්ෂයකටම හෝ අපේක්ෂකයකුටම අසාධාරණයක් හා විශේෂ වාසියක් ඇති නොවන පරිදි කටයුතු කිරීම'* එකෙණෙහිම උල්ලංඝනය වන බවක් නොපෙනෙන සේ කටයුතු කිරීමට මෙම මැතිවරණයේදී රාජ්‍ය සහ පෞද්ගලික මාධ්‍ය උත්සුක වන ආකාරයක් දක්නට ඇත.

එහෙත්, සියුම්ව නිරීක්ෂණය කිරීමේදී පෙනී යන්නේ, සෑම මාධ්‍ය ආයතනයකටම පාහේ සිය ආයතනික න්‍යාය පත්‍රය ක්‍රියාවට නැංවීමෙන් සපුරා බැහැර වීමට නොහැකි වී ඇති බවයි. එහෙයින්, සෑම පක්ෂයකටම සාපේක්ෂව සමාන කාලයක් හා අවකාශයක් ලබා දෙන බව පෙන්වමින්, තම න්‍යාය පත්‍රයට අනුකූල වෙනත් දේශපාලනික පුවත් ප්‍රචාරය මඟින් හෝ වෙනත් පක්ෂ හෝ සමහර අපේක්ෂකයන්/ෂිකාවන් අවවර්ධනයෙහි හෝ ප්‍රවර්ධනයෙහි නිරත වීමෙහි උපක්‍රමය මාධ්‍යය විසින් බහුලව යොදගනිමින් සිටින බව පෙනේ .මෙම තත්ත්වය රූපවාහිනී ( ***පසු සටහන් 01*** බලන්න) මෙන්ම මුද්‍රිත මාධ්‍යවලද( ***පසු සටහන් 02*** බලන්න) නිරීක්ෂණය කළ හැකිය.

(2).***යම් සිද්ධියක් සම්බන්ධව අපේක්ෂකයකු/ෂිකාවක සිදු කරන අදහස් දැක්වීම් ආවරණයේදී බලපෑමට පත් වන පාර්ශවයට එම සිද්ධිය ගැන ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ලැබිය යුතුය*** යන හයවන(6)උපමානයද මාධ්‍ය විසින් උල්ලංඝනය කර හෝ නොසලකා හැර ඇති බව නිරීක්ෂණය කළ හැකි විය(***පසු සටහන 03*** බලන්න ).

(3).උපමාන අංක දහය (10) අනුව ***'ඡන්ද විමසීම් කාල සීමාව තුළ ජනාධිපතිවරයා හෝ අග්‍රාමාත්‍යවරයා හෝ යම් අමාත්‍යවරයකු පළ කරන අදහස් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යය මඟින් ආවරණය කරනු ලබන අවස්ථාවක එය එම තැනැත්තා අයත් වන දේශපාලන පක්ෂයට දෙන ලද ආවරණයක් ලෙස සැලකිය යුතු බවත් '***, එම මැතිවරණයට තරග කරන ප්‍රතිවාදී දේශපාලන පක්ෂයක නායකයකුටද ඒ හා සමාන අවස්ථා ලබාදිය යුතු බවටත් දැක්වෙන උපමානය බොහෝ මාධ්‍ය ආයතන විසින් උල්ලංඝනය කර ඇති බවද නිරීක්ෂණය කළ හැකිය(***පසු සටහන 04*** බලන්න ).

(4). විසි දෙවැනි (22) උපමානය අනුව ***'සෑම මාධ්‍ය ආයතනයක්ම ආගමික විශ්වාස, ඇදහිලි, කථන භාෂා, වාර්ගිකත්වය, චාරිත්‍ර හා කුලගෝත්‍ර ඇතුළු විවිධ හේතු පදනම් කරගනිමින් ශ්‍රී ලාංකික ජනතාව තුළ වෛරය හා නොඉවසනසුලු බව ඇති කරවන ආකාරයේ ප්‍රචාරක කටයුතුවලින් බැහැර වීම්*** අත්‍යවශ්‍ය වුවද විශේෂයෙන්ම ආගම, වාර්ගිකත්වය ,භාෂාව හා

කුලගෝත්‍ර අනුව වක්‍රකාරයෙන් සමාජ විභේදන ඇති කරවන පුවත් පළ කිරීමේ ඇබ්බැහියක් සහිත මාධ්‍ය අතළොස්සක්ද නිරීක්ෂණ කණ්ඩායමට හඳුනාගත හැකි විය(***පසු සටහන 05*** බලන්න ).

(5). මෙවර මැතිවරණයේදී නව ඡන්ද ක්‍රමයක් හඳුන්වා දී ඇති අතර ඒ තුළ නාමයෝජනා ලැයිස්තුවල අනිවාර්ය කාන්තා නියෝජනය වැනි කරුණු කැපී පෙනේ. එහෙත්, මෙම නව තත්ත්වයන් පිළිබඳව ඡන්දදායකයා දැනුවත් කිරීම සඳහා වන පුවත්වල අවම බව විශේෂයෙන් නිරීක්ෂණය කළ හැකිවිය. උදහරණයක් ලෙස මෙවර මැතිවරණයේදී ඡන්දදායකයා සිය ඡන්දය භාවිත කළ යුතු ආකාරය පිළිබඳව සාපේක්ෂව ප්‍රමාණවත් අවකාශයක් හෝ වෙන් කර ඇත්තේ, මුද්‍රිත මාධ්‍යවලින් පමණක් වන අතර රූපවාහිනී මාධ්‍යවලදී එම තත්ත්වය ඉතා අවම බව නිරීක්ෂණය විය (***පසු සටහන 06*** බලන්න).

(6). මෙම මැතිවරණයේ නාම යෝජනා ලබාදීමේදී මෙන්ම නියෝජිතයන් පත්කිරීමේදී ද කාන්තා නියෝජනය අනිවාර්ය කර ඇති අතර ඊට සාපේක්ෂව කාන්තාවන්ට ලබාදෙන මාධ්‍ය ආවරණයද සමාන විය යුතු වන්නේ එය මෙරට ස්ත්‍රීපුරුෂ සමාජභාවයේ සමානත්වය (Gender Equity) පිළිබඳ හැඟවුම්කාරයක් ලෙසද හඳුනාගත හැකි බැවිනි. ඒ අනුව රාජ්‍ය හා පෞද්ගලික රූපවාහිනි නාලිකා ප්‍රවණතාවක් ලෙස කාන්තා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියනගේ හෝ අපේක්ෂිකාවනගේ මැතිවරණ රැළි ආවරණය කරන බව නිරීක්ෂණය කළ හැකි විය. එහෙත්, සිය ගුවන් කාලය තුළ ප්‍රචාරය කරන ලද සමස්ත අපේක්ෂක ආවරණය තුළ කාන්තාවන්ට සාධාරණ නියෝජනයක් ලැබී ඇති බවක් නිරීක්ෂණ කළ නොහැකි විය (***පසු සටහන් 07*** බලන්න ).

(7). මාධ්‍ය උපමාන අංක 27 යටතේ කියැවෙන පරිදි මාධ්‍ය ආචාරධර්මවලට අනුකූලව හා ඒවායින් බැඳී ක්‍රියා කිරීමේ වගකීම කෙරෙහි මැතිවරණ ආවරණයේදී පොදුවේ රූපවාහිනී හා මුද්‍රිත දෙඅංශයම ප්‍රමාණවත් අවධානයක් යොමු කර නැති බව නිරීක්ෂණය කළ හැකිවිය. ප්‍රවෘත්ති අන්තර්ගතය විශ්ලේෂණයේදී දක්නට ලැබෙන ප්‍රමාණවත් මූලාශ්‍රය නොමැතිකම, විවාදයට හේතු වන ප්‍රවෘත්ති වාර්තාවල ප්‍රවෘත්ති ලේඛකයාගේ නම සඳහන් නොවීම, සමහර

පුවත්වල ප්‍රවෘත්තිමය කරුණුවලට වඩා දේශපාලන අර්බුද හා අපේක්ෂක යහගුණ ඉස්මතු කර දක්වා තිබීම වැනි ලක්ෂණ ඒ අතර වේ(***පසු සටහන් 08*** බලන්න).

**පසු සටහන්**

(01). ප්‍රස්තාර අංක 06 බලන්න. මෙම වගුවේ දත්තවලට අමතරව, එක් පෞද්ගලික නාලිකාවක ප්‍රවෘත්ති තෝරා ගැනීමේ මූලික න්‍යාය පත්‍රයක් ලෙස අග්‍රාමාත්‍යවරයාට එරෙහි පුවත් තෝරා ගැනීම නිරීක්ෂණය කළ හැකිවිය. රාජ්‍ය නාලිකාවල මහින්ද රාජපක්ෂ මහතාගේ රූපමය හඬපට තෝරා ගැනීමේදී අවවර්ධනාත්මක රූපමය හඬපට තෝරා ගැනීමට අවධානය යොමු කර ඇති බව නිරීක්ෂණය කළ හැකි විය.

(02). ප්‍රස්තාර අංක 03 බලන්න.

(03). ජනවාරි 22 වන දින ඇත්ත පුවත්පතෙහි මුල් පිටුවෙහි සඳහන් ***'රෝසිට එජාපය තුළින්ම කැපිල්ලක්'*** යන පුවත සෘජුවම කොළඹ මහ නගර සභාවේ පුරපති අපේක්ෂිකාවට අදාළ වන අතර එහිදී රෝසි සේනානායක මහත්මියගේ අදහස් සඳහා නියෝජනයක් ලැබී නැත.

(04). වගු අංක 03 අනුව සෘජුව හෝ වක්‍රව මැතිවරණයට අදාළ පුවත් 214 න් 126 ක් ම වෙන්වී ඇත්තේ එ.ජ.නි.ස(65) සහ එ.ජා.ප (61) වෙනුවෙනි. ඊට සාපේක්ෂව ශ්‍රී.ල.පො.පෙ

, ජ.වි.පෙ සහ වෙනත් දේශපාලන පක්ෂ වෙත ඊට සමාන අවස්ථා හිමිව නොමැති අතර එ.ජ.නි.ස සහ එ.ජා.ප වෙනුවෙන් මෙලෙස වැඩි ඉඩකඩක් වෙන්වීම පිළිබඳ විමසීමේදී

නිරීක්ෂණය වූයේ ජනාධිපතිවරයාට සහ අගමැතිවරයාට අවස්ථා ලබාදීම මෙම තත්ත්වයට හේතුව බවයි.

(05). නිරීක්ෂිත දින තුනෙහි සෑම රූපවාහිනී සහ මුද්‍රිත මාධ්‍යයකම පොදුවේ ප්‍රධාන පුවතක් වූයේ පළාත් ප්‍රධාන අමාත්‍යවරයා විසින් ඌව පළාතේ පාසලක විදුහල්පතිනියක දණ ගැස්වූයේ යැයි කියන සිදුවීමයි. මෙම පුවත් ආවරණයේදී බොහෝ මාධ්‍ය විසින් වාර්ගිකත්වය ඉස්මතු වන ආකාරයට වාර්තා කළ අන්දම නිරීක්ෂණය විය (උදහරණයක් ලෙස ජනවාරි 22 වන දින දිවයින පුවත්පත මීට අදාළ සිදුවීම්වලදී ජාතිකත්වය ගෙනහැර දක්වමින් වාර්තාකරණය සිදුකර

ඇත්තේ සෙසු පුවත්පත් (ලක්බිම, අද) ඇතැම් අවස්ථාවල ජාතිකත්වය අවම වශයෙනි දක්වා තිබියදීය).

(06). වගු අංක 2 මඟින් මුද්‍රිත මාධ්‍යවල පුවත් වාර්තාකරණයත්, වගු අංක 3 මඟින් විද්‍යුත් මාධ්‍යවල පුවත් වාර්තාකරණයත් දැක්වෙන අතර එහිදී දැනුම්වත් කිරීමේ පුවත්වලට වෙන්වී ඇත්තේ පිළිවෙළින් සංඛ්‍යාත්මකව පුවත් 13 ක් සහ 6 කි.

(07). නිරීක්ෂිත දින තුනෙහි කාන්තා අපේක්ෂිකාවන් හෝ නියෝජිතයන් මැතිවරණ *වේදිකාවේ අදහස් දැක්වීම් සඳහාම වෙන්වූ විශේෂාංගයක් ජනවාරි 22 වන දින සිය ප්‍රවෘත්ති* විකාශය තුළ අන්තර්ගත කර තිබුණේ ජාතික රූපවාහිනිය පමණි. මෙම දින තුනෙහි සෙසු කිසිදු නාලිකාවක් එවැනි විශේෂාංගයක් සිය ප්‍රවෘත්ති විකාශ තුළ අන්තර්ගත කර නොතිබූ බව නිරීක්ෂණය කළ හැකිවිය. ඇතැම් නාලිකා සිය පුවත් විකාශයන්ගේ අන්තර්ගත කර ඇති මැතිවරණ වේදිකාවේ අදහස් දැක්වීම් ඇතුළත් විශේෂාංග තුළදී කාන්තා අදහස්වලට කිසිදු ඉඩක් වෙන්කර නොතිබූ බවද නිරීක්ෂණය කළ හැකිවිය.උදාහරණයක් ලෙස ජනවාරි 22 වන දිනයේදීම ස්වාධීන රූපවාහිනියේ මැතිවරණ වේදිකාවේ අදහස් දැක්වීම් සඳහා වෙන්ව තිබූ ***දේශපාලන කතා*** විශේෂාංගය තුළ කාන්තා නියෝජනයක් නොවීණ.

08). ජනවාරි 21 දින සිළුමිණ පුවත්පතේ පළවූ එක් පුවතක් වන්නේ '***ලංකා සීනි සමාගමට වාර්තාගත ශුද්ධ ලාභයක්***' යන්නයි. මැතිවරණයට වක්‍රව බලපාන මෙම පුවතේ මූලාශ්‍රය කර්මාන්ත සහ වාණිජ අමාත්‍ය රිෂාඩ් බදුර්දීන් මහතා බව සඳහන් කර තිබුණද එම මූලාශ්‍රයේ මූලාශ්‍රය පමණක් නොව පුවත ලියූ ලේඛකයාගේ නම හෝ සඳහන් වන්නේ නැත. ජනවාරි 21 දින දිවයින ඉරිදා සංග්‍රහයේ පළව ඇති '***ජනපති ධුර කාලය විමසන්න උපදෙස් දුන්නේ එජාප මන්ත්‍රීවරයෙක්*** 'යන පුවතේද මූලාශ්‍රයක් පැහැදිලිව සඳහන් නොවන අතර එම පුවත මැතිවරණය සඳහා වක්‍ර බලපෑමක් සහිත පුවතක් ලෙස නිරීක්ෂණය කළ හැකිවිය.